**2025-03-03 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

01. **කොලොන්නාවේ ජල ගැලීම් තත්ත්වය පාලනය කිරීම පිණිස යෝජිත නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා කමිටුවක් පත් කිරීම**

2024 ජුනි මසදී ජල ගැලීම් හේතුවෙන් කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිදු වූ හානි සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීමටත්, එම ප්‍රදේශයේ ජල ගැලීම් ඇති වීම සඳහා බලපාන මූලික හේතු සොයා බලා එවැනි තත්ත්වයක් නැවත ඇති වීම වළක්වා ගැනීමට අවශ්‍ය නිර්දේශ ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කිරීමටත්, කොලොන්නාව නගරය ප්‍රතිසංවිධානය සඳහා පුළුල් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමටත් කොළඹ දිස්ත්‍රික් ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීමට 2024-06-03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. ඒ අනුව, එකී කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාවේ නිර්දේශයන් ප්‍රමුඛතා පදනම මත කඩිනමින් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය මග පෙන්වීම සහ අධීක්ෂණය සඳහා ගරු අග්‍රාමාත්‍යතුමියගේ සභාපතිත්වයෙන් සහ අදාළ විෂයභාර අමාත්‍යවරුන්ගේ සාමාජිකත්වයෙන් හා අදාළ අනෙකුත් බලධාරීන්ගේ සහභාගිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

02. **ජාත්‍යන්තර ජල සම්මේලනය (IWC) හා 9 වන පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීම සහ ලෝක ජල දිනය සැමරීම**

ජල දූෂණය සහ මානව සෞඛ්‍ය සේවාවන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2015 වර්ෂයේදී සිය ප්‍රථම පර්යේෂණ සම්මන්ත්‍රණය පවත්වනු ලැබ ඇත. ඉන් පසු එම සම්මන්ත්‍රණය 2022 වර්ෂය දක්වා දේශීය ආයතන සහ පුද්ගලයින් සම්බන්ධ කර ගනිමින් අඛණ්ඩව පවත්වා තිබේ. 2022 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජලය සහ සනීපාරක්ෂාව සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රය පිහිටුවා ඇති අතර, ජාත්‍යන්තර ජල සම්මේලනය - 2022 සහ 7 වන පර්යේෂණ සම්මන්ත්‍රණය දේශීය මෙන්ම විදේශීය ආරාධිතයින්ගේ සහභාගිත්වයෙන් පවත්වා ඇත. 2023 වර්ෂයේදී පැවති ජාත්‍යන්තර ජල සම්මේලනය හා 8 වන පර්යේෂණ සම්මන්ත්‍රණය සඳහා රටවල් 09ක් සහභාගී වී තිබේ. "නවෝත්පාදන පර්යේෂණ ඩිජිටල්කරණය සහ අනාගතය සඳහා ඔරොත්තු දීමේ හැකියාව තුළින් තිරසර ජලය සහ අපජල කළමනාකරණය" යන තේමාව යටතේ ජාත්‍යන්තර ජල සම්මේලනය - 2025 සහ 9 වන පර්යේෂණ සම්මන්ත්‍රණය 2025 මාර්තු මස 19 සහ 20 යන දිනයන්හිදී ජලය සහ

සනීපාරක්ෂාව සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රයේදී පැවැත්වීමට සැලසුම් කර ඇත. ජාත්‍යන්තර ජල සම්මේලනයට සමගාමීව මාර්තු මස 22 දිනට යෙදෙන ලෝක ජල දිනය සැමරීම සඳහා සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 50 වන සංවත්සරය සැමරීම සඳහා මාර්තු මස 21 වන දින වැඩසටහනක් ද සැලසුම් කර ඇත. පර්යේෂණ සම්මන්ත්‍රණයේදී ජාත්‍යන්තර හා දේශීය පර්යේෂණ 100ක් පමණ එළිදැක්වීමටත්, ඒ සඳහා දේශීය මෙන්ම විදේශීය ආයතන නියෝජනය කරන 600කට වැඩි පිරිසක් සහභාගිකරවා ගැනීමටත් අපේක්ෂා කෙරේ. ඒ අනුව, එකී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. තෝරා ගත් දිස්ත්‍රික්කවල ජනගහන පාදක පිළිකා ලේඛනගත කිරීමේ වැඩසටහන හරහා පිළිකා පිළිබඳ ආවේක්ෂණය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

Bloomberg Philanthropies සහ ඕස්ට්‍රේලියානු රජය විසින් අරමුදල් සපයනු ලබන සෞඛ්‍ය සඳහා දත්ත (D4H) මුල පිරීමේ වැඩසටහන මඟින් තීරණාත්මක මහජන සෞඛ්‍ය තොරතුරු රැස් කිරීම සහ භාවිතය ශක්තිමත් කිරීම සඳහා අඩු හා මධ්‍ය ආදායම් ලබන රටවල් 20 කට වැඩි ගණනකට තාක්ෂණික සහාය සලසනු ලබයි. එම වැඩසටහන සමඟ සහයෝගීව කටයුතු කරනු ලබන Vital Strategies ආයතනය ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සඳහා දත්ත මුලපිරීමෙහි ප්‍රමුඛ තාක්ෂණික හවුල්කරුවා වශයෙන් කටයුතු කරමින් මේ වන විට වැඩසටහන් 03ක් ක්‍රියාත්මක කර ඇත. ඒ යටතේ වන මීළඟ වැඩසටහන වශයෙන් ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක ජනගහනය මත පදනම් වූ පිළිකා ලේඛනගත කිරීම ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීමට Vital Strategies ආයතනය විසින් එකඟතාව පළ කර තිබේ. යෝජිත ව්‍යාපෘතිය යටතේ එම ආයතනයේ ශ්‍රී ලංකාවේ මූල්‍ය ඒජන්සිය වන ශ්‍රී ලංකා සෞඛ්‍ය තොරතුරු සංගමය හරහා හඳුනාගත් ක්‍රියාකාරකම් සඳහා රුපියල් මිලියන 19.50ක පමණ අරමුදල් වැය කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා Vital Strategies ආයතනය සහ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. ත්‍රිකුණාමලය ඉහළ ටැංකි අංගනයේ ටැංකි විසිහතරක් (24) සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකා රජය, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම සහ ත්‍රිකුණාමල ඛනිජතෙල් පර්යන්ත සමාගම විසින් චීන වරායේ තෙල් ටැංකි අංගනයෙහි හිමිකාරිත්වය, සංවර්ධනය සහ භාවිතය සඳහා වන ගිවිසුමකට 2022-01-06 දින අත්සන් තබා ඇත. එම ගිවිසුමේ විධිවිධාන පරිදි ත්‍රිකුණාමල ඉහළ

ටැංකි අංගනයේ ඇති ටැංකි විසි හතරක් (24) ගිවිසුම ආරම්භ වන දිනයේ සිට වසර 50ක කාලයක් සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත බදු පදනම මත ලැබී ඇත. එකී තෙල් ටැංකි සංවර්ධනය කිරීම වසර 03ක් ඇතුළත නිම කිරීමේ අරමුණ ඇතිව තුන් අවුරුදු ව්‍යාපෘතියක් සැලසුම් කර ශක්‍යතා අධ්‍යයනයක් ඇතුළු මූලික ව්‍යාපෘති කටයුතු ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කරනු ලැබ ඇත. එම ව්‍යාපෘතිය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ඇතුළු අදාළ පාර්ශ්වයන්ගේ අනුමැතීන් මේ වන විට ලබා ගෙන තිබේ. ඒ අනුව, මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අරමුදල් මඟින් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **සියඹලාණ්ඩුව මෙගාවොට් 100 සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඉඩම් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ප්‍රදානයක් වශයෙන් ලබා දීම**

වසර 2030 වන විට රටේ විදුලිබල ඉල්ලුමෙන් 70%ක් පමණ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සපුරා ගැනීමට රජය අපේක්ෂා කරනු ලබයි. එම ප්‍රතිපත්තියට අනුව, සියඹලාණ්ඩුව මෙගාවොට් 100 සූර්ය විදුලිබල උද්‍යාන පහසුකම එක් ප්‍රධාන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගෙන ඇත. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගොවිතැන් කටයුතු හෝ වෙනත් වගාවන් සිදු නොකරන හෙක්ටයාර 219.7233ක භූමි භාගයක් හඳුනාගෙන තිබේ. යෝජිත ව්‍යාපෘතියේ උපායමාර්ගික වැදගත්කම සැලකිල්ලට ගනිමින් කඩිනමින් ආරම්භ කිරීමට හැකි වන පරිදි හෙක්ටයාර 219.7233ක ඉඩම ප්‍රදානයක් වශයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ලබා දීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන ආසියානු සංවර්ධන බැංකු ණය මුදලේ සහ ප්‍රදානයේ වලංගු කාලසීමාව දීර්ඝ කිරීම**

මධ්‍යම, උතුරු මැද, ඌව සහ සබරගමුව යන පළාත්වල ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව, සමානාත්මතාව සහ ප්‍රතිචාරාත්මකබව වැඩිදියුණු කිරීම අපේක්ෂා කරමින් ආසියානු සංවර්ධන බැංකු අරමුදල් මඟින් සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අදියර 02ක් යටතේ ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා වන මුල් මූල්‍යකරණය ඇමෙරිකානු ඩොලර් මිලියන 37.5ක ණය මුදලකින් හා ඇමෙරිකානු ඩොලර් මිලියන 12.5ක ප්‍රදානයකින් සමන්විත වේ. ඊට අමතරව, එම ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යකරණය වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 110ක ණය මුදලක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 3ක ප්‍රදානයක් ලබා ගෙන ඇත.

ව්‍යාපෘතිය සඳහා මුල් මූල්‍යකරණය යටතේ ලබා ගෙන ඇති ණය මුදල සහ ප්‍රදානය සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීම පිණිස ඒවායේ වලංගු කාලසීමාව තවත් වර්ෂයකින් දීර්ඝ කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ. ඒ අනුව, සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ මුල් ණය හා ප්‍රදානයෙහි වලංගු කාලසීමාව 2025-11-30 දින දක්වාත්, ණය මුදල ගිණුම් පියවා අවසන් කිරීමේ දිනය 2026-05-31 දින දක්වාත් දීර්ඝ කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **රජයේ නීති සම්පාදන වැඩසටහන**

2025 වර්ෂය තුළදී නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය විසින් අලුතින් හඳුන්වා දීමට අපේක්ෂිත පහත සඳහන් නීති සහ සංශෝධන හඳුන්වා දීමට අපේක්ෂිත දැනට බලාත්මක නීති රජයේ නීති සම්පාදන වැඩසටහන - 2025ට ඇතුළත් කිරීම පිණිස නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

**හඳුන්වා දීමට අපේක්ෂිත නව නීති:**

* ජාතික පානීය ප්‍රජා ජල සංවර්ධන පනත.
* ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතන පනත.
* චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශන මධ්‍යස්ථානය නීතිගත කිරීම සඳහා වන පනත.
* 2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ද ඇතුළත් කරමින් සහාධිපත්‍ය දේපළ සඳහා පහසුකම් සැලසීම පිණිස වන නව පනත.

**සංශෝධන හඳුන්වා දිය යුතු දැනට පවතින නීති:**

* 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත.
* 1974 අංක 2 දරන ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩල පනත.

1946 අංක 13 දරන නාගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත.

1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත.

2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත.

* 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත.
* 2021 අංක 13 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත.
* 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනත.
* 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනත.

08. **සංස්කෘතික ප්‍රකාශනයන්හි විවිධත්වය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ යුනෙස්කෝ (2005) සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අපරානුමත කිරීම**

යුනෙස්කෝ සංවිධානය විසින් සාමාජික රාජ්‍යයන්හි නිර්මාණය කරනු ලබන සංස්කෘතික ප්‍රකාශනවල විවිධත්වය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය අරමුණු කොට ගත් සම්මුතියක් 2005-10-20 දින සම්මත කර ඇති අතර, එම සම්මුතිය 2007-03-10 දින සිට බලාත්මක වී තිබේ. එම සම්මුතිය මේ වන විට සාමාජික රාජ්‍යයන් 156ක් විසින් අපරානුමත කර ඇත. එකී සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අපරානුමත කිරීම සඳහා 2024-09-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති නමුත්, මෙතෙක් එම සම්මුතිය අපරානුමත කර නොමැත. ඒ අනුව, සංස්කෘතික ප්‍රකාශනයන්හි විවිධත්වය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ යුනෙස්කෝ (2005) සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරනු ලැබීම පිණිස ප්‍රතිපත්තිමය අනුමැතිය අපේක්ෂාවෙන් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම**

දැනට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි සේවය කරනු ලබන විශ්‍රාමික මේජර් ජෙනරාල් එච්.එම්.යූ.හේරත් මහතාගේ කොන්ත්‍රාත් සේවා කාලය 2025-03-07 වන දිනෙන් අවසන් වීමට නියමිතව ඇත. ඒ අනුව, එදින සිට පුරප්පාඩුවීමට නියමිත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට විශ්‍රාමික මේජර් ජෙනරාල් සම්පත් කොටුවේගොඩ මහතා කොන්ත්‍රාත් පදනම මත එක් වසරක (01) කාලයකට පත් කිරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව වශයෙන් පිළිගැනීම**

ශක්තිමත් නිෂ්පාදන ආර්ථිකයක් මඟින් වසර 2030දී ඇමෙරිකානු ඩොලර් බිලියන 120ක මූර්ත දළ දේශීය නිෂ්පාදනයක ඉලක්කයක් සහිතව තිරසර ආර්ථික වෘද්ධියක් සහ සංවර්ධනයක් අරමුණු කර ගනිමින්, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කර තිබේ. එය ආර්ථික, සමාජීය, පාරිසරික හා දේශපාලනික ඇතුළු සියලු අංශ නියෝජනය වන පරිදි පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර 04ක් යටතේ ගොනු කොට ඇත:

* පරිසමාප්ත ජීවිතයක් - සුවපහසු රටක්
* ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක්
* නවීන ජීවිතයක් - පොහොසත් රටක්
* අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක්

එම ප්‍රධාන ක්ෂේත්‍ර 04 යටතේ උප ක්ෂේත්‍ර 40ක් හඳුනාගෙන ඇති අතර, එම ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රතිපත්ති මූලධර්ම සහ ගත යුතු ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව ලෙස පිළිගැනීමටත්, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසින් ඔවුන්ගේ කාර්යයන් ඒ අනුව සැලසුම් කර ක්‍රියාත්මක කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

************